# ඩී. එස්. සේනානායක විද්‍යාලය

**කොළඹ 07.**

**දෙවන වාර පරීක්ෂණය - 2016**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය**

සිංහල

**I** පත්‍රය                                        කාලය පැය තුනයි

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

1. **පහත දැක්වෙන උද්ධෘත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න).**

අ. **I** මෙසේ දවසරින ඒ කුමාරිකා එක් දවසක් වලින් පලාඵල ගෙනෙන්නී අතරමග ගල් කඳුරැළියක් දැක, ''ඉස තුබූ පැස තබා කඳුරැළියෙහි ස්නානය කෙරෙමි''යි බැස නහා අලුත් කසායෙන් ඇඟ උලා ගොඩ නැඟී වල්කලා හැඳගෙන කඳුරැළි තෙර සිටියා ය. ඇගේ ශරීර ශෝභාවෙන් සියලු වන ලැහැබ රන් රැසින් තවරන කලක් පරිද්දෙන් ඒකාලෝක විය. එකල්හි දානව රාක්ෂසයෙක් ගුවනින් යනුයේ පවනඹල රන්ලියට නිහා දුන් තුනු සිරින් වොරඳනා ඒ ළඳ තුනු සිරි දැක ඇ කෙරෙහි පිළිබඳ සිත් ඇති රාක්ෂසයා මෙසේ කීයේය. ''හැසී සිටිනා වූ කරහ ප්‍රදේශයන් ඇති කරපරිචිත මධ්‍යම ප්‍රදේශයන් ඇති ජනශූන්‍ය වූ මේ වන මධ්‍යයෙහි ගල් කඳුරැළිය අස නහා ගොඩ නැඟි බව හේතු කොටගෙන පවනඹල පල්ලව පත්‍රයක් මෙන් චලිතවීම් ඇතිව උදකලාව මෙතැන්හි සිටිනා වූ තෝ කවරෙක්ද? මා විසින් විචාරන ලද ස්ත්‍රිය, තීගේ නාම ගෝත්‍රය ද බන්ධූ ද නොවලහා ඇති සැටි මට කියව.

i. **''අලුත් කසායෙන්''** මෙහි කසායෙන් යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.
ii. කුමරිය කඳුරැලි තෙර සිටියේකුමක් කොට අවසන් වීද?
iii. වන ලැහැබ රන්රැසින් තවරන කලක් පරිද්දෙන් ඒකාලෝක වීමට හේතුව කුමක් ද?
iv. 'පවනඹල රන් ලියට නිගා දුන් තුනුසිරින් වොරඳනා' යන්නෙහි සරල අදහස ලියන්න.

(ලකුණු **04** යි)

**II** එ කල හෙල්ලෝලිය නම් ගමැ නායක චණ්ඩාලයාගේ දේවී නම් වූ දූවක් මල් පිණිස ගසට නැඟී ඒ ගසැ නිල් අතුපතර අතුරෙහි දිලිහෙමින් නිල් වලාකුළෙකැ පහළ විදුලියක් සේ මහ මේ ගබක් අතුරෙන් පෙනීගිය පුන්සඳ මඬලක් සේ තමාගේ අග්‍රප්‍රාප්ත වූ රූප සොභාවෙන් දසදිග හොබවමින් හෝපලුමල් කඩා පැළැඳැ පල්ලවයක් අතින් ගෙන සිටියහ. එසේ සිටියා වූ සැඬොල් දූව දැක රාජකුමාරයෝ එකෙණෙහි උපන්නා වූ බලවත් ස්නේහ ඇතිව මහත් වූ ආශ්චර්යයට පැමිණ පූර්ව වාසනාවෙන් ඇ කෙරෙහි උපන්නා වූ ප්‍රේම ධරාගත නොහී මුඛයෙන් වමාරන්නාක්හු මෙන් ඇ හා සමඟ කථා කරන්නාහු සොඳුර, තෙපි කවරෙක් ද? කොයින් ආ කෙනෙක් ද? දෙව්ලොවින් බට දේවතා දූවක් ද? නොහොත් මනුෂ්‍ය ස්ත්‍රියක් ද? මේ ලෝකයෙහි තොප හා සමාන රූ ඇති අන් ස්ත්‍රියක නොදුටු විරීමි.

1. ''දසදිග හොබවමින්'' මෙහි හොබවමින් යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.
**ii.** මෙහි එන රාජකුමාරයාගේ නම කුමක් ද?
**iii.** මෙහි එන උපමාවක් හා උපමේයක් ලියන්න.
**iv.** 'අග්‍රප්‍රාප්ත වූ රූප සෝභාවෙන් දසදිග හොබවමින් හෝපලුමල් කඩා පැළැඳ පල්ලවයක් අතින් ගෙන' යන්නෙහි සරල අදහස ලියන්න.

(ලකුණු **04** යි)

**III** කල් ගිය සේ තවත් බඩ දරු කෙනෙක් ඇති වූය. දෙවන වරෙහි ද වදන අවස්ථාවහි දී දෙමව්පියන් ළඟට කැඳවා ගෙන යන්ට පැරැත්ත කියා පියා උන් නො ගිවිස්නා හෙයින් උපන් දරුවන් පයින් යන්ට අබල හෙයින් උනුත් වඩා ගෙන බඩ දරුවනුත් බඩින් හැර ගෙන නික්මුණාහ. සමුණන් ලුහුබඳවා ගෙන ගොසින් රඳවන්ට උත්සාහ කොටත් නො රඳා නික්මුණවූ ය. සමුණෝත් කැටිව නික්මුණවූය. මෙසේ එක්ව යන කලට නොකල් නොවේලා කොට ලා මහ වැස්සෙක් නැගී ය. ඒ වේලාවට ගසන විදුලියෙන් හා මේඝ නාදයෙන් හා වස්නා වැස්සෙන් ආකාශය අතුරු සිදුරු නැති විය. ඒ වේලාවට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විළිත් පහරටනට වන. ආස ගුගුරන්නා සේ හඬ ගසන්ටත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසව දුකුත් බෝ වි ය. සමුණන් බණවාලා විලිත් පහරන්නට වන.

1. ඇය දරුවන් ද රැගෙන පිටත්ව ගියේ කොහි යන අදහසින් ද?
ii. රචකයා නොකල්හි ඇතිවූ වැස්සෙහි බිහිසුණු බව වර්ණනා කරන්නේ කෙසේ ද?
iii. මෙහි සඳහන් උපමාවක් ලියන්න.
iv. ''සමුණන් බණවා ලා විලිත් පහරනට වන'' යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?

(ලකුණු 04 යි)

**IV** දිව'සර කය රුසිරින් පෑ දන සකය
සැදි අලකය ඇඳැ නළලතෙහි තිලකය
සිටි නිසැ කය ළද කොමළඟනන් දැකය
පරතර කය වැදැ යව මහැ නොවැළැ කය

එළි කොට අ ව ට රිවිබ ට සිඳු මැඳුරතට
එක විට ලොවට එළිබට ගන'දර කඳට
රොසකොට යු ද ට අඹර ට සඳ එන කලට
වැලි තොට ග ම ට ලැගුමට ගොස් මඳ නො සිට

1. කවි දෙකෙහි ඇති සන්ධි පද දෙකක් විසන්ධි කර ලියන්න
ii. මෙහි සඳහන් කාන්තාවන්ගේ ස්වභාවය කෙබඳු ද?
iii. ''ගන'දර කඳට රොසකොට යුදට අඹරට සඳ එන කලට'' යන්නෙහි අදහස කුමක් ද?
iv. දෙවන කවියෙහි ට කාරය භාවිතයෙන් නැගෙන කාව්‍යෝක්තිය කුමක් ද?

(ලකුණු 04 යි)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

1. ''දරුවන් වදන්ට මා ඔබ ගිය මැනැවැ''
ii. ''ස්වාමීනි, නුඹ වහන්සේ විසින් මාගේ පුතණුවන් උපන් දවස් වරයක් දෙනලදි''
iii. ''මෝහට සොරකම් කරන ද්‍රෝහියා යයි නොසිතා මෛත්‍රී කරව''
iv. ''මෝඩයා! මොකට ද ඌ බය ගන්නන්නේ, ඌ කියන්නේ රමණීය දෙයක්''
v. ''ඇයි මාව තනි කරලා යන්නේ? තාත්තත් මාව දාල ගියා''

(ලකුණු 08 යි)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

තැනින් තැන ඉරී ගිය, කිලිටි වී ගිය ගවොම
දවස් ගණනාවකින් තෙල් පොදක් නොදුටු හිස
එක අතෙක ඉරී ගිය පරණ පත්තර පිටුව
ඇ සිටී අවන්හල දොරකඩෙහි හැමදාම

උයා ඇති මුත් රසට මගෙ දිවා භෝජනය
එපා වී ගියේ කිම
හදවතේ ඇඳුණා ද ඇගේ අසරණ දෙනෙත
කිසිදිනක ඇසෙන්නට ගායනා නොකළ ඇගෙ
සිහින් සෝබර ගීය ඇසුණා ද දෙසවනට

සති අන්තයෙ දිනෙක කුඩා දියණියන් හට
අනෙක මසවුළු සමඟ බත් කඩක් කවන්නට
කොතෙක් දරමි ද වෙහෙස
කුඩා දැතෙහි රැඳෙන ඇගෙ දිවා භෝජනය
ගේ පුරා විසිර යයි

අවන්හල දොරකඩෙහි නෙත් අයා සිටින්නී
බත් උළක් වැටෙන තෙක් ඉරුණ කඩදාසියට
කෙසේ නම් වෙනස් වෙද මගේ දියණිය ඇයට
දෙදෙනාම එකම එක අහස යට උපන් කල

(ලකුණු **16** යි)

2. ''සද්ධර්ම රත්නාවලිය කතා රසයට මුල් තැන දෙමින් රචිත ගද්‍ය කෘතියකි.'' නිර්දිෂ්ට කථාවස්තු ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු **15** යි)

නැතහොත්

''ජාතක කතා කරුවා විශ්වසනීයත්වයෙන් යුතු කතා පුවත් ගෙනහැර පෑමේ කුසලතාවෙන් යුතු රචකයෙකි'' නිර්දිෂ්ට කථාවස්තු ඇසුරින් මෙය පැහැදිලි කරන්න. (ලකුණු **15** යි)

3 ''සද්ධර්මාලංකාර කතුවරයාගේ අරමුණ සත්‍ය කථා පුවත් ඉදිරිපත් කරමින් යහපත් සමාජයක් නිර්මාණය කරගැනීමයි'' මේ කියමන විභාග කරන්න. (ලකුණු **15** යි)

4. ''ගිරා සන්දේශය ස්වභාව සෞන්දර්යයෙන් යුතු වර්ණනාවලින් සමන්විත සන්දේශයකි.'' වර්ණනා දෙකක්වත් ඇසුරෙන් විමසන්න. (ලකුණු **15** යි)

5. ''මලගිය ඇත්තෝ නවකතාව පුද්ගල චරිතවල ඇති සංකීර්ණ හැසිරීම් රටාවන් විනිවිද පෙන්වන නවකතාවකි.'' උදාහරණ සහිතව විමසන්න. (ලකුණු **15** යි)

6. ''එක් ප්‍රබල සිද්ධියකින් පුද්ගල හැසිරීම් හා සමාජ හැසිරීම් විනිවිද දකින්නට කෙටිකතා කරු සමත්වෙයි.'' නිර්දිෂ්ට කෙටිකතා දෙකක් ඇසුරෙන් මේ කියමන විමසන්න.

(ලකුණු **15** යි)

7. ''මානව හිතවාදීත්වයෙන් යුතුව සමාජය දෙස බලන්නට නූතන පද්‍ය රචකයින් දැක්වූ කුසලතාව ප්‍රශංසනීය ය'' . මෙම කියමන උදාහරණ සහිතව විමසන්න. (ලකුණු **15** යි)

8. ''ප්‍රේක්ෂකයාට ශෘංගාර රසයත් නාට්‍ය රසයත් එකවර ලබාදෙන්නට රත්නාවලී නාටකය සමත් වෙයි.'' උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු **15** යි)

**ඩී. එස්. සේනානායක විද්‍යාලය**

**කොළඹ 07.**

දෙවන වාර පරීක්ෂණය - 2016

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (13 ශ්‍රේණිය)**

**සිංහල**

**II පත්‍රය**

කාලය පැය තුනයි

**1 ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

---

1.

1.1 නාසික්‍ය අක්ෂර පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ශ, ෂ, ස, හ, ෆ　　(2) ඞ, ඤ, ණ, න, ම　　(3) ප, ඵ, බ, භ, ම

(4) ඟ, ජ, ඬ, ඳ, ඹ　　(5) ය, ර, ල, ව,

1.2 පද සතරෙහි ම **නිවැරදි අක්ෂර සහිත** පද පේළිය තෝරන්න.

(1) මර්ධනය, වර්ධනය, සම්ප්‍රධාය, ත්‍යාග ප්‍රදානය

(2) නිදර්ශන, විස්මය, ශීඝ්‍රගාමී, ශිෂ්ටාචාරය

(3) ප්‍රතිඵලය, සජ්ජායනය, පුස්ථකාලය,ප්‍රස්ථාවනාව

(4) පාපිෂ්ඨ, කණිෂ්ඨ, දර්ශණය, ඓශ්වර්යය

(5) දෘෂ්ඨිය, දෘෂ්‍යාබාධ, නෂ්ඨප්‍රාප්ත, කොට්ඨාශය

1.3 **අකාරාදී පිළිවෙළ** අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) දුටුගැමුණු, විජයබාහු, පරාක්‍රමබාහු, මහසෙන්

(2) මහාවංසය, බෝධිවංසය, චූලවංසය, දීපවංසය

(3) සීගිරිය, දඹුල්ල, අවුකන, රුවන්වැලිසෑය... 

(4) කලාවැව, තිසාවැව, නුවරවැව, පරාක්‍රමසමුද්‍රය

(5) අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, දඹදෙණිය

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අනුනාසික අක්ෂර වර්ගාන්තාක්ෂර ලෙසද හැඳින්වේ

(2) ස්වර අක්ෂර හ්‍රස්ව දීර්ඝ ලෙස වර්ග නොකෙරේ.

(3) ව්‍යඤ්ජනාක්ෂරය ස්වරයක් සමගම යෙදිය යුතු නැත.

(4) අන්තස්ථාක්ෂරවල ස්වර ස්වභාවයක් නැත.

(5) සඤ්ඤක අකුරු අනුනාසික ලෙස ද හැඳින්වේ.

1.5 **යංශය, ගැටපිල්ල, රකාරාංශය හා ගයනුකිත්ත** අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කර්මානුරූප, සාහිත්‍යසූරී, කෞතුකාගාරය,ක්‍රමික

(2) විද්‍යමාන, කෘතහස්ත, ප්‍රතිබිම්බය, ගෞරවණීය

(3) ශාස්ත්‍රාලය, ප්‍රවීණ, කෛලාශය, ඖෂධීය

(4) විප්‍රලම්භ, ප්‍රතිඵලය, වර්ෂාකාලය, විද්‍යාලය

(5) ව්‍යක්ත, සමෘද්ධි, අප්‍රතිහත, අභිවෘද්ධිං

1.6 **තත්සම** වචන පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) අභිවාදන, වික්‍රමාන්විත, ගාම්භීර, පාඨශාලාව　　(2) ඡත්‍රය, හස්ති, විස්වය, අහස

(3) විචිත්‍ර, මන්දිර, ප්‍රතිසන්ධි, විසල්　　(4) ප්‍රතිභාව, චිත්තාකර්ශනීය, ශාස්ත්‍රීය, ගැටලුව

(5) සමුද්‍ර, ධාර්මික, අභිෂේක, නිර්මල

1.7 එකිනෙකට **අනුරූප වන සේ වචන යෙදී ඇති පද පේළිය** තෝරන්න.

(1) පාඨශාලා ආචාර්ය, විචිත්‍ර ධර්මය, රංග ශාලා, පුෂ්ප සුගන්ධය
(2) කාර්ය පටිපාටිය, සමන්ත කූඨය, රූ රැජින, මාර්ග සලකුණු
(3), නිර්භය ප්‍රකාශ, කිතු ඝෝෂාව, පඤ්ච ශීලය, අපේක්ෂා භංගත්වය
(4) අභ්‍යන්තර අර්බුද, විවෘත ප්‍රකාශ, පාඨශාලා සිසුන්, විශාරද ඥානය
(5) කර්මාන්වීත ව්‍යාදිය, සෞන්දර්ය රසාස්වාදය, මිනිස් වර්ගයා, දේශීය නිපැයුම්

1.8 මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) අකුසල් - කුසලය, පින, යහපත, සුචරිතය
(2) කනිෂ්ඨ - ජ්‍යෙෂ්ඨ, දෙටු, උසස්, ශ්‍රේෂ්ඨ
(3) අනුවණ - නුවණැති, උගත්, නූගත්, විදග්ධ
(4) නින්දා - ප්‍රසංසා, පැසසුම්, කීර්තිය, කිතුගොස
(5) අස්ථිර - ස්ථිර, ස්ථාවර, තිර, නිත්‍ය

1.9 මුලින් දැක්වෙන පදයට **සමානාර්ථ පදයක් නොවන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) කොවුල් - කෝකිලයා, පරපුටුවා, කොවුලා, කොහා
(2) උදය - අලුයම, පාන්දර, උදෑසන, ප්‍රභාතය
(3) අල්ප - ස්වල්ප, ටික, මඳ, සුභ
(4) රිවි - දිනපති, දිවයුරු, දිනිසුරු, තරිඳු
(5) මංගල - සුභ, යහපත, හොඳ, වාසනාව

1.10 **මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා** පද පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කරමින්, කරව, බලවයි, බලා
(2) කියා, නටනටා, නටවා, වසිද්දී
(3) බසිමින්, දිනුවොත්, රකිව්, බිඳ
(4) දිනුවොත්, නටමින්, ගයද්දී, ගයව
(5) දුටුවොත්, රහා, නටව, කියමින්

1.11 **පූර්වක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා** පද පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) බලව, නරඹා, ගය ගයා, සෙත් වේවා
(2) බලා, සොයමින්, රකිව්, කරවයි
(3) ගොස්, අඬමින්, වසිද්දී, වඩිනු මැනවි
(4) නටමින්, උගන්වා, දකිනු, රකීවා
(5) රැක, දුවමින්, හඬා, බසිමින්

1.12 **කෘදන්ත පදයක්** අන්තර්ගත **නොවන** වරණය තෝරන්න

(1) රැකුණු, මැරුණු, බැලුණු, බිඳුණු
(2) ගැයුම්, බැලුම්, නැටුම්, කියුම්
(3) බලන, කරන, ගයන. ගගන
(4) සිතූ, කෙරූ, සිතූ, මැරූ
(5) දර්ශනීය, පූජනීය, වන්දනීය, පානීය

1.13 **උපසර්ග** පදයක් ඇතුළත් **නොවන** පද පේළිය තෝරන්න.

(1) උපනගර, අතිගරු, නිරනුමාන, සම්මානය
(2) අවමාන, අනුශූර, නිසල, විවාද
(3) කුකවි, නිර්ධන, දුශ්චරිත, සංවර්ධනය
(4) දුර්ගුණ, උදුල, විසංවාද, ප්‍රතිඋපකාර
(5) දුර්ගන්ධ, සමලංකෘත, සසල, අග්නි

1.14 ව්‍යාකරණානුකූලව **නොගැළපෙන පදයක් සහිත** පද පේළිය තෝරන්න.

(1) මෙන්, වැනි, සමඟ, ඊයේ
(2) කරන, බැලෙන, නැටිලි, කියමන්
(3) රුක්කත්තන, ළිංපඩිය, ලිග්ගල, කුකවි
(4) පන්සිළු, මව්පිය, තැඹිලිතෙල්, යාවජීව
(5) නිර්ධන, අනුනායක, අභෞතික, අව්‍යාජ

1.15 **තද්ධිත** පදයක් ඇතුළත් **නොවන** පද පේළිය තෝරන්න

(1) දැහැමි, නැණවත්, නැකති, පාපිෂ්ඨ
(2) ඉහටි, සිහිනි, දැවමුවා, අගාරික
(3) දේශීය, සාමාර්ථ්‍යය, පෞරුෂ, පුණ්‍යවන්ත
(4) ඇමරිකානු, කර්ණාටක, සුවිශේෂ, විශේෂතා
(5) සිටාණ, මුහුලස, දැවමය, මුදුනත්

1.16 තද කළු අකුරින් මුද්‍රිත පදවල නොගැළපෙන ව්‍යාකරණ අංගය දැක්වෙන වරණය තෝරන්න.

(1) **අත්තෙන්** ගිලිහුණු මල් බිම පතිත විය. (අවධි කාරකය)

(2) **බුදුන්ගේ** ධර්මය සතහට සැප ගෙනෙයි. (සම්බන්ධ කාරකය)

(3) **රටවැසියන් කෙරෙහි** කාරුණික විය යුතුය. (කරණ කාරකය)

(4) **ත්‍යාග ලාභීන්ට** සම්මාන හිමිවිය (සම්ප්‍රදාන කාරකය)

(5) **දරුව**, යහපතෙහි හැසිරෙන්න. (ආලපන කාරකය)

1.17 ව්‍යාකරණානුකූල ව **නිවැරදි** වාක්‍යය තෝරන්න.

(1) පියුම්හු විකසිත වෙයි.

(2) දරුවෝ සඳහා උද්‍යාන සකස් කොට තිබේ

(3) අප විසින් ගුරුවරුන් පුදනු ලැබේ.

(4) මුව රැළ වනයේ ඔබ මොබ සැරිසරති.

(5) සිසුහු හොඳින් විභාගය සමත්වෙතියි ගුරුවරු සිතූහ.

1.18 **වැරදි ප්‍රකෘතියක්** සහිත පද පේළිය තෝරන්න.

(1) ගව, තාප්ප, මල්, යක්

(2) කුරුළු, දරු, වලස්, ළමා

(3) නෙත්, කපුටු, මිතුරු, වනිතා

(4) ගිරා, වඩු, බළල්, ගොන්

(5) බමර, මුව, ගවර, ගස

1.19 **එකම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත **නොවන** වරණය තෝරන්න.

(1) එකිනෙක, නෙතගින්, මුලිනුපුටා, ඔවුනොවුන්

(2) ගුරුතුමා, මිණිබරණ, මුනිඳු, බුදුකුරු

(3) කොළොම්තොට, සුළංපහර, මංමුලා, මිහින්තලය

(4) පත්තිරු, කොස්සැට, බත්තුළු, ඉන්නල

(5) ඉඳියාප්ප, ගෙවුයන, වියවුල්, වටොර

1.20 **සමාස පදයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.

(1) පන්සිල්, සිව්සස්, තිසරණ, දසරජදම්

(2) සැදැහැති, කුකවි, යාවජීව, අනුබල

(3) ගත්කරු, නිසයුරු, සැත්කම්, මහලුනිවාස

(4) දිනකර, මින්දද, සුන්තුරු, සහසැස්

(5) ගුරුදෙගුරු, මව්පිය, තුරුලතා, දෙව්මිනිස්

**(මුළු ලකුණු 20 යි)**

2. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගී කාව්‍ය භාෂාව තත්කාලීන ව්‍යවහාර භාෂාව පදනම් කොට ගෙන ප්‍රභවය ලැබුවක් නමුදු කාලයාගේ ඇවෑමෙන් ව්‍යවහාර භාෂාව වෙනස් වූ අතර ගී කාව්‍ය භාෂාව වෙනස් නොවී පැරණි ස්වරූපයෙන් ම පැවතිණි. ගී කවීන් සංස්කෘත කාව්‍ය ඇසුරු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොදු ව්‍යවහාරයට සම්බන්ධයක් නොදක්වන සකු වචනවලින් බිඳගත් පද මාලාවක් ද ගී කාව්‍යයට ඇතුළත් විය. ජයවර්ධනපුර යුගය වන විට, කාලයට අනුකූලව වෙනස් වූ ව්‍යවහාර භාෂාවත් එසේ වෙනස් නුවූ ගී කවි බසත් අතර ඇති පරතරය විශාල විය. එහෙයින් ජයවර්ධනපුර යුගයේ සිටි කවීන්ගේ අදහස් පළ කිරීමට එය අනුචිත මාධ්‍යයක් විය. සිවුපද කාව්‍ය භාෂාව, ජයවර්ධනපුර යුගයේ පැවති ව්‍යවහාර භාෂාවට බොහෝ දුරට ආසන්න කිරීම, සිවුපද කවීන්ගේ පරමාර්ථය විය. සිවුපද බස ඉපැරණි ගී කව් බසට වඩා ජයවර්ධනපුර යුගයේ ව්‍යවහාර භාෂාවට කිට්ටු හෙයිනි එය අපට පැරණි ගී කව් බසට වඩා පහසුවෙන් අවබෝධ කරගත හැක්කේ. කාව්‍ය භාෂාව බොහෝ දුරට වෙනස් කිරීමත්, සිවුපද විරිත ජනප්‍රිය කිරීමත් ජයවර්ධනපුර කවීන් විසින් කරන ලද වැදගත් පෙරළියකි.

(i) මෙහි සඳහන් ආකාරයට කාලයාගේ ඇවෑමෙන් වෙනස් වූයේ කුමක් ද?

(ii) සංස්කෘත කාව්‍ය ඇසුරු කිරීමෙන් ගී කාව්‍යයට කුමක් සිදුවී ද?

(iii) ජයවර්ධනපුර යුගයේ සිටි කවීන්ගේ අදහස් පළ කිරීමට අනුචිත මාධ්‍යයක් වූයේ කුමක් ද?

(iv) සිවුපද කවීන්ගේ පරමාර්ථය වූයේ කුමක් ද?

(v) ජයවර්ධනපුර කවීන් විසින් සිදුකරන ලද වැදගත් පෙරලිය කුමක් ද?

(ලකුණු 10 යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සශ්‍රීකත්වය පතා සෑම වැවක ම පාහේ සිදු කරනු ලබන 'මුට්ටි නැමීමේ මංගල්‍යය' ද ප්‍රධාන අභිචාරාත්මක පූජා කර්මයකි. 'වැවේ රාජකාරිය' නැතහොත් මුල් මංගල්ලේ නමින් ගැමි වහරේ එන මෙය 'මුට්ටි නැමිල්ල' නමින් පොදුවේ හැඳින්වේ. මුට්ටි නැමිල්ල මංගල්ලේ සමස්ත වැව් බැඳි රාජ්‍යයට ම පොදු වන අතර එය පවත්වන කාල සීමාව ඒ ඒ පළාත් අනුව වෙනස් වේ. අයියනායක දෙවියන් ප්‍රධාන කොටගෙන පවත්වනු ලබන වැව ආශ්‍රිත ව සිදු කෙරෙන මේ අභිචාර විධිය වටා වටිනා ගැමි සංස්කෘතික ලක්ෂණ රාශියක් දැක ගත හැක්කේ එම පූජා කර්මය සිදු කෙරෙන අනුපිළිවෙළ නිරීක්ෂණය කිරීමෙනි. මුට්ටි නැමීමේ චාරිත්‍රය සඳහා තෝරා ගනු ලබන්නේ වැව් බැම්මේ දිය කෝල්බඩ පිහිටි ජලයට නැමුණු පූජනීය ගසකි. එම ගසේ අතුවල අගිසි කොටස එක ම මට්ටමකට කපා එහි අඩියක පමණ කොටසක පොත්ත ඉවත් කර ඒ මත මහත් ගෞරවාදර සහිත ව මුට්ටි නැමීම සිදු කෙරේ.

නානු මුරය හා දිය කැපීම යන උතුම් සංස්කෘතික උත්සව ද ඇතැම් නිකායවල භික්ෂු උපසම්පදාව සිදු කිරීම ද ජල නිධි මුල් කොට සකස් වූවකි. ජන සංස්කෘතියට වැව කෙතරම් සමීප ව තිබේ දැයි යන්න වැව යන්නෙන් අවසන්වන ග්‍රාම නාමවලින් අනාවරණය වෙයි. ඇතිලිවැව, මහවැව, පලුවැව, මොරවැව, නිකවැව, වලස්වැව, ගලෙන් බිඳුණු වැව, දිගා වැව, මීගස් වැව, හල්මිල්ල වැව, තිඹිරි වැව, පලුගස් වැව, කෝන්වැව ආදී ග්‍රාම නාම මීට හොඳ ම උදාහරණ වේ.

(ලකුණු 15 යි)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

i. ත්‍රස්තවාදය නිසා වැනසෙන ලෝක සාමය

ii තාක්ෂණික දියුණුව හමුවේ මිනිසාගේ ක්‍රියාකාරීත්වය කෙබඳු ද?

iii නාගරික සංවර්ධනය සහ පරිසර ගැටලු (ලකුණු 25 යි)

4. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න

i. ගුරුවරු දරුවන් යහමග යවති.

ii. ජනාධිපති තුමා උත්සව සභාව ඇමතුවේ ය.

iii. ඔවුහු අප ප්‍රශංසාවට ලක්කළහ.

iv. දඩ බල්ලෝ අහිංසක මුවන් මැරූහ.

v. සම්භාව්‍ය සාහිත්‍ය ගීත රචකයෝ උසස් ගීත නිර්මාණය කරති.

(ලකුණු 10 යි)

5. නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. අප විභාගය සමත් ( වෙතියි / වෙමුයි ) දෙමව්පියෝ සිතූහ.

ii. මෙවර දක්ෂ ( ක්‍රීඩකයෝ / ක්‍රීඩකයන් ) ශ්‍රී ලංකාවෙනි..

iii. ( ඇතමෙක් / ඇතමෙකු ) ඉතා උනන්දුවෙන් විභාගය සඳහා සූදානම් වෙති..

iv. මහා නියගය හේතුකොටගෙන ( ජලාශයෝ / ජලාශ ) සිඳී යති.

v. ගුණවත් ඕ තොමෝ පින්වත් කුමරකු ජනිත ( කළාය / කළෝය). (ලකුණු 10 යි)

6. තද කළු අකුරින් දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි දක්වන්න.

i. අතු **කඩා** මොර කන්නා **සේ**

ii. **බුද්ධිමත්** ලේඛකයෝ **පොත්පත්** ලියා පැසසුම් ලබති.

iii. **දුසිරිතෙන්** දුරුවී කුසල් වර්ධනය **කර** සසර දිනිය යුතු ය.

iv. **නිලුපුල්** වැනි ඇස් ඇති ඇය සැමගේ **නෙත්සිත්** වසී කළාය

v. උදෑසන හිරු **පායද්දී** විලෙහි **නෙළුම්මල්** පිබිදීම ස්වාභාවිකය (ලකුණු 10 යි)